# ගම් සභාව

**මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන හා මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කරන ගම් සභාව රාජ්‍ය තන්ත්‍රයේම කොටසකි. එය 'සෙව නැලි පාර්ලිමේන්තුවක්' හැටියට ද හැඳින්විය හැකිය.**

ශ්‍රී ලංකාවේ ගම්බද ප්‍රදේශ ගම් සභා මගින් පරිපාලනය කිරීමේ ක්‍රමයට දීර්ඝ ඉතිහාසයක් ඇත. පුරාතනයෙහි මුල් බැසගත් පාලන ක්‍රමයට නැකම් කියන පැරණිම 'සංස්ථාව' වශයෙන් දනට ඉතිරිව ඇත්තේ ගම් සභාව පමණි. ක්‍රිස්තු පූර්ව සිවු වැනි සිය වසෙහි පණ්ඩුකාභය රජ තුමන් විසින් මුළු දිවයින තුළ ම ගම් සීමා බෙද වෙන් කරන ලද බව මහා වංශයෙහි දක්වේ. දිවයින පුරා ග්‍රාමීය මණ්ඩල විශේෂයක් තිබුණ බව පැරණි ශිලා ලේඛනවලින් අනාවරණය වෙයි.

**1948 දී නිදහස ලැබුණාට පසුව පාර්ලිමේන්තු ආඥා පණතක විධි විධාන ප්‍රකාර ගම් සභා ක්‍රියාත් මක විණි. සාමාජිකයන් තෝරා පත් කර ගනු ලැබුයේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීන් තෝරා පත් කර ගන්නා ආකාරයට ම නිදහස් ඡන්ද විමසීමක ප්‍රතිඵල අනුවය. මේ අනුව, ගම් සභාව සෙවනැලි පාර්ලිමේන්තුවක්' බඳු සංවිධානයකි. දනට, දිව යින පුරා ගම් සභා 550 ක් පමණ ඇත.**

ගම් සභා නියෝජිතයන් තෝරා ගැනීමේ දී පක්ෂ ක්‍රමය පුළුල් වශයෙන් භාවිතා වන අතර, දේශපාලන පක්ෂ ප්‍රතිපත්තිවලට ගම් සභා පාලන කටයුතු වල දී ප්‍රමුඛ ස්ථානයක් හිමි වෙයි.

## බලතල

ගම් සභාවක බලතල හා කාර්යයන් අතුරෙන් වැදගත් ඒවා මෙසේය.

( අ ) යම් යම් සේවාවන් පිහිටුවීම හා නඩත්තු කිරීම පිළිබඳව ඇති වෙනත් නීතිවලට ද යටත්ව, සභාවේ වත්කම අනුව, මහජන ශුභ සිද්ධියට හිතකර පොදු සේවාවන් පිහිටුවා පවත්වා ගෙන යාම සහ පළාත් පාලන ඇමතිවරයාගේ අනුමැතිය පරිදි මෙවැනි සේවාවන් සැලැසෙන ප්‍රදේශවලින් වරිපනම් බද්දක් අය කිරීම. මෙකී බලතල ප්‍රකාර සමහර ගම් සභා මගින් කසල ශෝධන හා පොදු වැසිකිළි, ජල සැපයුම්, විදුලිබල සැපයුම් ග්‍රාමීය වෙළඳ පොළවල්, ආයුර්වේද බෙහෙත් ශාලා, නිවාස ක්‍රම, පුස්තකාල, ප්‍රජා මණ්ඩල, ක්‍රීඩා භූමිමාතා දරකාභිවෘද්ධි මධ්‍යස්ථාන ආදී සේවාවන් පවත්වා ගෙන යනු ලැබේ.

(ආ) අධිපාරවල්, ප්‍රසිද්ධ මාර්ග, බෝක්කු, කාණු, ඒදඬු පාලම්, අම්බලම්, මඩම් දිය පිලි, ප්‍රසිද්ධ ළිං, ඇළ දෙළ, වැව්, තොටුපලවල් සුසාන භූමි, තණ බිම්, ගාල්, කඩ පොළවල්, සතුන් මරණ ස්ථාන ආදී ග්‍රාමීය වැඩ කටයුතු.

(ඇ) මහජන සෞඛ්‍යය හා සනීපය ආරක්ෂා කිරීමට හෝ මහජන ශුභ සිද්ධිය හා සැප පහසුකම් සපුරා ලීමට අවශ්‍ය වැඩ කටයුතු

(ඈ) සතුන් හණ ගැසීම, කෘෂිකර්මය පිළි බඳ පර්යේෂණාත්මක වැඩ කටයුතු ආදිය සඳහා ගම් සභා අරමුදලින් මුදල් වැය කිරීම.

( ඉ ) දුර්භික්ෂ, වසංගත රෝග ආදී ආපද හෝ ස්වාභාවික විපත්ති ආදියේ දී හෝ මහජනයාට පිහිටවීම.

ගම් සභාවලට යටකී කටයුතු ඉටු කිරීමට සිදුව ඇත්තේ මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන හා මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලවය. ගම් සභාව රාජ්‍ය යන්ත්‍රයේ ම කොටසක් බැවිනි. ගම් සභා පිළිබඳ දේශපාලනමය හා පරිපාලනමය වගකීම පළාත් පාලන ඇමතිවරයා සතු ය. බල තල ක්‍රියාත්මක කරනු ලබන්නේ පළාත් පාලන කොමසාරිස්වරයා මගිනි. ගම් සභාවල කටයුතු සුපරීක්ෂා කිරීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්වරු සෑම දිස්ත්‍රික්කයක් සඳහා ම සිටිති.

ගම් සභාවක බල ප්‍රදේශය නිර්ණය කරනු ලබන්නේ ඇමතිවරයා විසිනි. සාමාන්‍ය වශයෙන් ගතහොත් ගම් සභාවක බල ප්‍රදේශයට 19, 000ක පමණ ජනකායක් ජීවත් වෙන වර්ග සැතැපුම් 45 ක පමණ ප්‍රදේශයක් දනට ඇතුළත්ව ඇත.

වැදගත් ග්‍රාමීය ආයතනයක් වශයෙන් ගම් සභාවට තිබූ තැන, 1950 න් පසුව මධ්‍යම ආණ්ඩුවට සම්බන්ධ නා නා විධ සේවාවන් ඉටු කෙරෙන සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ආදිය රට පුරා වැඩි වැඩියෙන් බිහිවීමත් සමඟ ම දුරස් වන්නට විය. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල විශාල වශ යෙන් වෙනස්කම් සිදු වී ගෙන යන නමුත් ගම් සභාවක චිරාගත කටයුතු රටාවෙහි සැලකිය යුතු වෙනසක් සිදු නොවීම මීට ප්‍රධාන හේතුවකි.